සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022 (2023)

# 47 - සිංහල සාහිත්‍ය රසාස්වාදය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතු ව ඇත.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය 2022 (2023)

## 47 - සිංහල සාහිත්‍ය රසාස්වාදය

### ලකුණු දීමේ පටිපාටිය

| | | |
|---|---|---|
| I පත්‍රය | - | 1, 2 ප්‍රශ්න අනිවාර්ය වේ |
| II පත්‍රය | - | 1 ප්‍රශ්නය අනිවාර්ය වේ |
| | - | 2,3,4,5 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න 02ක් පමණයි |

| | | | | |
|---|---|---|---|---|
| I පත්‍රය | - | 1 ප්‍රශ්නයට | - | ලකුණු 20 |
| | | 2 ප්‍රශ්නයට | - | ලකුණු 20 |
| | | | | ලකුණු 40 |

| | | | | |
|---|---|---|---|---|
| II පත්‍රය | - | 1 ප්‍රශ්නයට | - | ලකුණු 30 |

| | | | | |
|---|---|---|---|---|
| II පත්‍රය | - | එක් ප්‍රශ්නයකට 15 බැගින් ප්‍රශ්න 02කට | - | ලකුණු 30 |

| | | | | |
|---|---|---|---|---|
| මුළු ලකුණු | - | I පත්‍රය | - | ලකුණු 40 |
| | | II පත්‍රය (I ප්‍රශ්නය) | - | ලකුණු 30 |
| | | 15 බැගින් ප්‍රශ්න 02කට | - | ලකුණු 30 |
| | | | | ලකුණු 100 |

# අ.පො.ස. (සා.පෙළ) - 2022 (2023)
# 47 - සිංහල සාහිත්‍ය රසාස්වාදය

## ආවරණය කෙරෙන ඉගෙනුම් පල

### I පත්‍රය

01.

I. අ. ආ - • කුස ජාතක කතාවේ අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි.

II. අ. ආ - • නන්ද මහතෙරුන් වහන්සේගේ කතා වස්තුවේ අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි.

III. අ. ආ - • චරිත, අවස්ථා, සිද්ධි නිරූපණය පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.

IV අ. ආ - • නිර්දිෂ්ට පද්‍ය කියවා අදහස් පැහැදිලි කරයි.

V. අ. ආ - • පද්‍ය නිර්මාණවලින් ධ්වනිත වන අදහස් අගය කරයි.

02.

I. සිට V දක්වා

- කතා වස්තුවේ චරිත, අවස්ථා හා සිද්ධි පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.
- නන්ද තෙරුන් වහන්සේගේ කතා වස්තුව රස විඳිමින් විචාරය කරයි.

**නැතහොත්**

02.

II. සිට V දක්වා

- පද්‍ය නිර්මාණවල අරමුණු හඳුනා ගෙන පැහැදිලි කරයි.
- පද්‍ය නිර්මාණවලට පාදක වූ අත්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- පද්‍ය නිර්මාණවලින් ධ්වනිත වන අදහස් ඉදිරිපත් කරයි.
- කාව්‍යමය උපක්‍රම කෙරෙහි අවධානය යොමු කරමින් රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

## II පත්‍රය

01. (අ) සිට (ඈ) දක්වා

- පද්‍ය නිර්මාණවල අරමුණු හඳුනා ගෙන පැහැදිලි කරයි.
- පද්‍ය නිර්මාණයට පාදක වූ අත්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- පද්‍ය නිර්මාණවලින් ධ්වනිත වන අදහස් අගය කරයි.
- කාව්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙමින් විචාරය කරයි.

02.

- කෙටිකතාවේ කතා සාරය ඉදිරිපත් කරයි.
- කෙටිකතාවේ චරිත හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- කෙටිකතාව රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

03.

- පද්‍ය නිර්මාණවල අරමුණු පැහැදිලි කරයි.
- පද්‍ය නිර්මාණවලට පාදක වූ අත්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- පද්‍ය නිර්මාණවලින් ධ්වනිත වන අදහස් අගය කරයි.
- කාව්‍යෝපක්‍රම කෙරෙහි අවධානය යොමු කරමින් රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

04.

- ජාතක කතාවේ කතා සාරය ඉදිරිපත් කරයි.
- ජාතක කතාවේ චරිත ලක්ෂණ විග්‍රහ කර දක්වයි.
- ජාතක කතාවේ අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි.
- කුස ජාතකය රස විඳිමින් විචාරයේ යෙදෙයි.

05.

- පද්‍ය නිර්මාණවල අරමුණු හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- පද්‍ය නිර්මාණවලට පාදක වූ අත්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- පද්‍ය නිර්මාණවලින් ධ්වනිත වන අදහස් අගය කරයි.
- කාව්‍යෝපක්‍රම කෙරෙහි අවධානය යොමු කරමින් රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022 (2023)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිත කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ........................................
........................................ ✓ △ $\frac{4}{5}$
........................................

(ii) ........................................
........................................
........................................ ✓ △ $\frac{3}{5}$

(iii) ........................................
........................................
........................................ ✓ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ —එකතුව→ □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම
   - I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
   - II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
   - III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
   - IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
   - V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.
   - **VI. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත්**

**පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර X ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- (I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක නම් සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***

## 47 - සිංහල සාහිත්‍ය රසාස්වාදය - I පත්‍රය

1. (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු දී ඇති හිස්තැන්වල පමණක් ලියන්න.

(i) "දෙව්නි එක්කෙනෙකුන් තබා දරුවන් දෙදෙනෙකු දෙමි."

(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?

(අ) ශක්‍ර දේවේන්ද්‍රයා / සක් දෙව්ඳු

(ආ) මෙම ප්‍රකාශය කළේ කාහට ද?

(ආ) සීලවතී දේවියට /සීලවතී බිසවට / ඔක්කාක රජුගේ බිසවට

(ii) "තෙපි තුලුන් කරා ගොසින් නිධාන පාවා ගනුව."

(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?

(අ) බිම්බා දේවිය / යශෝධරා දේවිය

(ආ) මෙම ප්‍රකාශය කළේ කාහට ද?

(ආ ) රහල් කුමරුන්ට/ රාහුල කුමරුන්ට

(iii) "අතේ කවුද දන්නේ සමහරු කියන්නේ සන්නිපාත උණෙයි කියලා"

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

ඉයෝනා / ඉයෝනා පොටපොෆ් / ඉයෝනා නැමැති අශ්ව රථ පදවන්නා

(ආ) මෙම පාඨය ඇතුළත් නිර්මාණයේ නම ලියන්න.

(ආ) වැලපීම/ වැලපීම කෙටිකතාව

(iv) **දියසෙන** උදාවන සිය කිරණින් — මහරු
**මෙදියන** දිවා නිසි දුරුවෙයි ගන — අඳුරු
සිරිමත රජතුමිඳු දුටු පමණින් — සොඳුරු
ඇතුළත පිටත දිව රෑ හැමෙය — දුක'දුරු

(අ) මෙහි අවසන් කවි පද **දෙකෙහි** අදහස ලියන්න.

(අ ) ශ්‍රීමත් වූත් යහපත් වූත් රජතුමිඳු දුටු පමණින් ම දවාලෙහිත් රාත්‍රියෙහිත් ඇතුළත හා පිටත පවතින දුක නැමැති අඳුර පහ වී යයි.

(ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

**දියසෙන** ........ සූර්යා / හිරු / ........

**මෙදියන** ........ මෙලොව /මේ ලෝකයේ ........

(v) මොහොතක ඉසිඹු
ලබනා විනා
නැත අතරමඟ
නතර වන වාසනා

මගක් නම්
ඒ මගක් ම යි
නොමඟක් නොවෙයි
මඟ නවතිනා

(ආ) මෙම පැදි පෙළේ රචකයාගේ නම ලියන්න.

රත්නා ශ්‍රී විජේසිංහ

(ආ) 'මොහොතක ඉසිඹු ලබනා විනා, නැත අතරමඟ නතර වන වාසනා' යන්නෙන් මතු කෙරෙන අර්ථය ලියන්න.

ඉතා කෙටි කාලයක් විවේකයක් ලබනවා හැර / මිස අතරමඟ නතර වීමට වාසනාවක්/ හැකියාවක්/ නැත.

*(ලකුණු 04 x 5 = 20යි)*

(02)

**2.** පහත දැක්වෙන ගද්‍ය-පද්‍ය කොටස් දෙකෙන් **එක්** කොටසකට **පමණක්** පිළිතුරු සපයන්න.

"මෙසේ බුදුන් දෙව්රම්හි වසන කලට ආයුෂ්මත් වූ නන්ද තෙරුන් වහන්සේ බැදෑවත් බිසොවුන් කියා ලූ බස් නමැති වයිහි පෙම් නමැති දිවුළු ලා ඉහු කොට, සිත් නමැති ඊතක ඇදගූ හෙයින්, ඒ බලා ශාසනයෙහි උකටලීව, 'මා ශාසනයෙහි ඇලුම් නැත. සිවුරු හරිමි'යි හිතමිත්‍ර වහන්දැට කී සේක. බුදුහු ඒ පවත් අසා නන්ද මහතෙරුන් වහන්සේ කැඳවාලා 'සැබෑ ද නන්දයෙනි, භික්ෂූන්ට මෙබන්දක් කිවුදැ'යි විචාරා වදාරා 'සැබව ස්වාමීනි'යි උන් වහන්සේ කී කල්හි 'නන්දයෙනි, සිවුරු හරණේ කුමක් නිසා දැ'යි විචාරා වදාළ සේක. එසේ විචාරා වදාළ බුදුන්ට 'ස්වාමීනි, මා මහණවන්ට සිහින් නොසිතින් එන ගමනේ දනවුකලණ බිසවු සෝඩාපු හිසකේ හිඹි නො ගන්නා සෙක් අවුත් 'වහා අව මැනැවැ'යි යන බසක් කිවූ ය. මම ඒ බස එක් වන් සඳහන් කරන්නෙමි මෙබන්දක් සිතමි'යි කී සේක.

එකල බුදුහු තිබී බලවත් වන ලෙඩක් බෙහෙදක් දී සන්හිඳුවන කලක් මෙන් ඔබගේ එබඳු අනුභාවයක් නැසත් තමන් වහන්සේගේ අනුභාවයෙන් අත අල්වා ගෙන තව්තිසා දෙව්ලොවට වඩනා සේක් අතුරුමඟ තවදැලි සේනක් මවාලා ඒ සේනේ දා ගිය කණුවෙක දා වක ගැසී ගිය වැඳිරිමැල්ලක මවාලා තවුතිසා දෙව් ලොවට වැඩ සක්දෙව්ඳුහුගේ පන් සියයක් පමණ දෙවඟනන් පෑලා 'කුමක් ද නන්දයෙනි, රුවින් වූ කලී මේ දෙවඟනෝ යහපත්තු ද නොහොත් දනවු කලණ බිසවු යහපත්තු දැ'යි විචාළ සේක.

(i) මෙම පාඨයෙහි ඇතුළත් උපමාවක් උපුටා ලියන්න.

- *බස් නැමැති වයිහි*
- *පෙම් නැමැති දිවුළු ලා* / දිවුල් ලමු
- *සිත් නැමැති ඊයක*
- *තිබී බලවත් වන ලෙඩක් බෙහෙදක් දී සන්හිඳුවන කලක් මෙන්*

***(මෙම උපමාවලින් එකක් හෝ උපුටා දක්වා ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න)***

***(ලකුණු 04යි)***

(ii) "අතුරු මඟ තවදැලි ජේතක් මවාලා ඒ ජේතේ දා ගිය කණුවෙක දා වික ගැලී ගිය වැදිරිමැල්ලක මවාලා" මෙම පාඨයෙහි අර්ථය ලියන්න.

*දෙව් ලොවට වඩනා මඟ අතරතුර අලුතින් ගිනි හැලූ ජේතක් මවා ඒ ජේතෙන් පිලිස්සී ගිය (පිච්චුණු) කණුවක පිළිබිඹි වකුටු වී ගිය ගෙහු වැදිරියක මවාලා*

*(ලකුණු 04යි)*

(iii) නන්ද තෙරුන් වහන්සේ සිවුරු හැරීමට තීරණය කළ හේතුව කෙටියෙන් පැහැදිලි කරන්න.

- ***ජනපද කල්‍යාණිය කෙරෙහි වූ ප්‍රේමය නිසා***

බුදුන් වහන්සේ සමඟ විහාරයට යන නන්ද කුමරු පිළිබඳ ව ජනපද කල්‍යාණියට දැන ගන්නට ලැබී නැමෙන් තෙත් වූ හිස කෙස් වේලා ගැනීමටවත් නොසිට දිව අවුත් නන්ද කුමරුන්ට ඉක්මනින් නැවත පැමිණෙන ලෙස දන්වා සිටි බැවින් නන්ද තෙරුන් වහන්සේ ඇය කෙරෙහි වූ ප්‍රේමයෙන් සිවුරු හැර යාමට තීරණය කළේ ය .

*(ලකුණු 06යි)*

(iv) නන්ද තෙරුන් සිවුරු හැර යාම වළක්වනු පිණිස බුදුන් වහන්සේ ගත් ක්‍රියා මාර්ගය කුමක් ද?

නන්ද කුමරුන් දිව්‍ය ලෝකයට කැඳවාගෙන ගොස් ශක්‍ර දෙවියන්ගේ පන්සියයක් දෙවඟනන් පෙන්වා මැනවින් සිල් රැක රහත් වීමට නොහැකි වුවහොත් මරණින් මතු දෙව්ලොව ඉපිද මෙවන් දෙවඟනන් ලබා ගැනීමට හැකි බවට තමන්වහන්සේ ඇප වන බව පවසා මහණ දම් පිරීමට ඇල්ම ඇති කිරීම යි.

*(ලකුණු 06යි)*

**නැතහොත්**

පොල්දිග හොරනෑව රකුසෝ
මගේ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදා ගන්න පොරොව ගන්න
කලු රෙදි පොට
මොකටද මේ
කිරුවලට ඉරා දමන්නෙ.

කුරුල්ලන්ට ගල් ගහලා
උන් හොඳටම බිය කරලා
මල් පොහොට්ටු සිඟැස්සිලා
කඩුනු හෙලනවා.

ඇස් දෙක මම අරින්නෙ නෑ
කුරුලු කරන් හාවනාව
නැවතත් යන්නට යනවා
මම
මගේ දැනැත ලෝකයටම.

**(i) "පෙරදිග ගොරහැඩි රකුසෝ" යනුවෙන් කවියා ආමන්ත්‍රණය කරන්නේ කාහට ද?**

උදෑසන නැගෙන හිරුට ය .

*(ලකුණු 04යි)*

**(ii) "මල් පොහොට්ටු තිගැස්සිලා කඳුළු සලනවා" යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.**

මල් පිපිදීමයි. මල් පුපුදින විට එවායේ රැඳී තිබූ පිනි විසිර යාමයි.
(මල් පිපීම යැයි සඳහන් කර තිබුණ ද පූර්ණ ලකුණු ප්‍රදානය කරන්න)

*(ලකුණු 04යි)*

**(iii) කවි පන්තියේ සඳහන් පරිදි කවියාගේ නින්දට සිදු වූ බාධා දෙකක් ලියන්න.**

- ඉර උදා වීම /ඉර එළිය වැටීම
- කුරුල්ලන් නාද කිරීම

*(ලකුණු 06යි)*

**(iv) සුලබ අත්දැකීමක් දෙස කවියා හෙළන අපූර්ව දෘෂ්ටිය පිළිබඳ ඇගයීමක් කරන්න.**

- රාත්‍රිය ගෙවී එළිවීම සුලබ අත්දැකීමකි. නිරන්තරයෙන් සිදු වන මේ සිදුවීම දෙස අපූර්ව ආකාරයකින් කවියා බලා ඇත.
- රාත්‍රී කාලය ගෙවී සූර්යාලෝකය පැමිණීම කවියා දකින්නේ තමන් නිදා ගැනීමට පොරවා ගත් කළු රෙදි පොට තීරුවලට ඉරා දමන ආකාරයෙනි.
- උදෑසන කුරුල්ලන් අවදි වී හඬ නගන ආකාරය කවියා දකින්නේ, ඔවුන්ට ගල් ගසා බිය කළ ආකාරයෙනි.
- හිරු උදාවත් සමග මල් පිපීමද, කවියා මෙය දකින්නේ, කුරුල්ලන් බියගෙන හඬ නැගීම නිසා මල් පොහොට්ටු තිගැස්සීමට ලක් වූ ලෙසිනි.
- මල් පොහොට්ටු තිගැස්සිලා කඳුළු සලනවා යනු, උදෑසන මල් පිපිදෙන විට එම මල් පොහොට්ටු මත පතිත වී ඇති පිනි බිඳු බිමට වැටීමයි.

***(මෙම කරුණු ප්‍රකට වන සේ සපයන ලද පිළිතුරකට පූර්ණ ලකුණු ප්‍රදානයක් කිරීම මැනවි)***

*(ලකුණු 06යි)*

1. පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් රසාස්වාදයක් ලියන්න.

වැහි වලා කුළ, පැ කළ යැ යි ඔබේ
නො හොබිනි යි කිසි ලෙස් නො පසොස් නො වන්
සිරුරු පැයෙනු'ගත් සුදනෝ ලොවේ
නො සඳහන් උතුමන් ගුණයෙන් විනා.

පැතැ-නැගී අහසේ පැසිරී ගොසින්,
ඔහ ගිමින් මිදුවා සත සිත් නොසින්,
කුඹුරු-වැව්-පොකුණුත් පුරවා දියෙන්,
ලොවට දෙන්නා ඔබ යි අහරත් පැනුත්.

තද අහ ඔබ ගේ පැනැයක් වලා,
මොනරු පිල් විදහා රඟ දෙත් නදින්,
අඹුතුලයෙන් පඬුවෙන් ඔව ලත් සෙයින්,
තුරු ලියත් ලිය-ලබ සැනැහී දියෙන්.

සුදු වලා තුළ ඔබ් මැ අහස් තුළේ
ඉහළ යෙයි; ඔබ යැම පහත් වැ මැ යි
එ පුදුමෙක් ද? උසස් තැණවත් දනෝ
ගුණ බරින් නැඹුරුණෙ'වි පවසිත් නිසින්

කළට ගැන්ම ද බෝ මැ අමාරු වූ
කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරි වෙයි උතුමන් සත වාසයෙන්
නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්.

ගුණ බලා ඔබ ගේ ලෙය සඹා දනම්
'ඔබ'ය් අන් කිසිවෙක් නිසි නැ' කියා
විදුලියක් පැතැ පත් රන දම් සෙයින්
පළඳවන්නෙ ඔබේ ගෙලෙ මැ යි මලක්.

- මෙම පැදි පෙළට පාදක වූ අත්දැකීම

➤ මෙම පැදි පෙළට පාදක වී ඇත්තේ වැසි වලාකුළක් මගින් සුදන දුදන ගතිගුණ කියා පෑම පිළිබඳ අත්දැකීමකි.

*උදා :*
***"සිරුරු පැයෙනු'ගත් සුදනෝ ලොවේ..."***

➤ වැහි වලාකුළට සජීවී ගුණය ආරෝපණය කරමින් 'ඔබ' යනුවෙන් ආමන්ත්‍රණය කර ඇත.
*උදා :*
***"වැහි වලාකුළ පැ කළ යැයි ඔබේ..."***

➢ අජීව වැහි වලාකුළක ගති ස්වභාවය පොදු ජන සමාජයෙහි වෙසෙන පුද්ගල චර්යා සමග සසඳමින් සියුම් සමාජ විවරණයක් සිදු කිරීමට කවියා උත්සාහ දරා ඇත.

උදා :

*"ඒ පුදුමයක් ද? උසස් නැණවත් දනෝ*
*ගුණබරින් නැමුණෙ'වි පවතිත් නිතිත් ..."*

වැනි අදාළ උදාහරණ තිබිය යුතු යි.

*අන්දැකීම විස්තර කර ඇත්නම් ලකුණු 04යි.*
*උදාහරණය ලබා දී ඇත්නම් ලකුණු 02යි.*
*(ලකුණු 04 +02 = 06යි)*

ii
- එම අත්දැකීම ප්‍රතිනිර්මාණය සඳහා කවියා යොදා ගත් සිද්ධි හා අවස්ථා

➢ වැහි වලාකුළක් ආශ්‍රයෙන් පරිසරයේ සිදුවන ස්වාභාවික සංසිද්ධි හා අවස්ථා කවියා මේ සඳහා යොදා ගෙන ඇත.

➢ වැහි වලාකුළ වර්ෂාව ලබා දෙමින් කුඹුරු හා වැව් පොකුණු දියෙන් පුරවමින් පොළොවේ ශිම්භානය නිමා කරමින් සශ්‍රීක කරවන ආකාරය කවියා විචිත්‍ර ලෙස ඉදිරිපත් කරයි.

උදා :

***"කුඹුරු වැව් පොකුණුත් පුරවා දියෙන්..."*** වැනි උදාහරණ

➢ වැහි වලාකුළ වර්ෂාව රැගෙන එන විට එම දර්ශනයෙන් පරිසරය සතුටට හා ප්‍රබෝධයට පත් වන ආකාරය, මොනරුන්ගේ නර්තනයෙන්, තුරු ලතා ප්‍රාණවත් වීමෙන් නිරූපිත ය.

උදා :

***"මොනරු පිල් විදහා රඟ දෙත් නදින්..."***

➢ උසස් ඥානවන්ත පුද්ගලයෙකුගේ ගුණවත් හා අනතිමානී චරිත ස්වභාවය විවරණය කිරීම සඳහා සුදු වලාකුළු අහසේ ඉහළින් ගමන් කරද්දී දියෙන් පිරුණු වැහි වලාකුළු පහතින් ගමන් කිරීම යොදා ගෙන ඇත.

උදා :

***"සුදු වලාකුළු බෝ මැ අහස්    කුසේ.."***

➢ අමිහිරි වූ මුහුදු වතුර වැහි වලාකුළ තමන් වෙත ඇද ගත් පසු මිහිරි වන්නා සේ උතුම් පුද්ගලයන්ගේ ඇසුරින් නිවට ගති සහිත පුද්ගලයන් උසස් බවට පත් වන බව කවියා පෙන්වා දෙයි.

උදා :

***"කටට ගැත්ම ද බෝ මැ අමාරු වූ..."***

➢ අහසේ විදුලිය කෙටීම නම් ස්වාභාවික සංසිද්ධිය කවියා දකින්නේ, වැහි වලාකුළෙහි උසස් ගුණාංග වෙනුවෙන් ස්වභාව ධර්මය විසින් උපහාර පුදනු ලැබීමක් ලෙසිනි, එනම් විදුලිය රන් දම්වැලක් ලෙස වැහි වලාකුළෙහි ගෙල පළඳා සොබා දහම උපහාර පුදන බව කවියා දකියි.

උදා :

***"විදුලියත් පැහැපත් රන දම් ලෙසින් ..."***

***මෙවැනි කරුණු සහිත ව උදාහරණ ආකාරවත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දී තිබිය යුතු ය.***

*උදාහරණයකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.*
*අදාළ විස්තරයට ලකුණු 03යි.*
*(ලකුණු 03 +03 = 06යි)*

11

- **මෙම පද්‍ය පන්තියේ භාෂා භාවිතය**

➢ 'හුදු හෙළ බස' හෙවත් 'අමිශ්‍ර සිංහල භාෂා ව්‍යවහාරය' මෙම පද්‍ය පන්තිය සඳහා යොදා ගෙන ඇති බව පෙනේ. 'ඇ' කාරය භාවිතය කැපී පෙනෙන ලක්‍ෂණයකි.

උදා :
***"සිබැ ය", "නෙත් මැ", "පහන් වැ මැ යි"***

➢ මෙම කවි පෙළේ රචකයා වන කුමාරතුංග මුනිදාසයන් 'හෙළ හවුල' නම් භාෂා සංවිධානයේ පුරෝගාමියා ය. හෙළ හවුලේ සාමාජිකයන් විසින් හුදු හෙළ බස හෙවත් නුමුසු සිංහලය නම් ලේඛන කටයුතු මෙන් ම නිර්මාණ සඳහා ද යොදා ගැනීම කැපී පෙනෙන ලක්‍ෂණයකි.

උදා :

***"පණිවිත්..", "කඹා දහම්", "රන දම්", "පැමෙනු ".***

➢ කෙටි වචනවලින් රිද්මානුකූල පද ගැළපීමක් මෙම පද්‍ය පන්තියෙහි දැක ගත හැකි ය.

උදා:

***"පැන තැලී..", "කද - අසා ... "***

➢ වැහි වලාකුළට 'ඔබ' යනුවෙන් ආමන්ත්‍රණය කරමින් පුද්ගලයෙකු අමතන ආකාරයට පද්‍ය පන්තිය රචනා කර ඇත.

උදා:
***"ගුණ බලා සිහිගේ ..."***

➢ ව්‍යාකරණ ගැන සැලකිලිමත් වෙමින් උක්තයට අනුව ආඛ්‍යාතය ගළපයි.

උදා:

***"මොනරු - රඟදෙත්.."***
***"පුදනෝ - නොහඳුනත්.."***

➢ සන්ධි පද භාවිතයට ගෙන ඇත.

උදා:
***" නැමුණු + එවි.."***
***"මඩ + හැර ..."***

***මීට අමතරව තවත් භාෂා ලක්‍ෂණ ලියා ඇත්නම් ලකුණු දෙන්න. මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දී තිබිය යුතු ය.***
***උදාහරණයකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.***
***අදාළ විස්තරයට ලකුණු 03යි.***
***(ලකුණු 03 +03 = 06යි)***

14

- **සමාජයේ විවිධ පුද්ගල චර්යා නිරූපණය කිරීමට කවියා ගෙන ඇති උත්සාහය**

➢ වැහි වලාකුළක ස්වභාවය පාදක කර ගෙන සමාජයේ විවිධ පුද්ගල චර්යා සියුම් ලෙස නිරූපණය කිරීමටත් එමගින් සමාජ විවරණයක් සිදු කිරීමටත් කවියා උත්සාහ ගෙන ඇත.

➢ 'කළු' සහ 'සුදු' යනුවෙන් පුද්ගලයන් බෙදා වෙන් කිරීම සඳහා පොදු ජන සමාජයේ පවතින සම්මතයට කවියා මෙම පද්‍ය පන්තිය මගින් අභියෝග කර ඇති බව පැහැදිලි වේ.

➢ 'කළු' පැහැය අයහපත් පුද්ගලයන් හැඳින්වීම සඳහාත් 'සුදු' පැහැය යහපත් පුද්ගලයන් නිරූපණය කිරීම සඳහාත් සමාජ සම්මතයක් ලෙස යොදා ගන්නත් මෙම පද්‍ය පන්තියේ දී කවියා ප්‍රකාශ කරන්නේ සිරුරේ පැහැයෙන් පුද්ගලයාගේ හොඳ නරක තීරණය කළ නොහැකි බව යි.

උදා : ***" සිරුරු පැමෙනු ගත් පුදනෝ.."***

➤ වැහි වලාකුළ කළු පැහැ වුව ද ලෝකයේ සිත් සතුටු කරවන බව පැවසීම මගින් සුදන චර්යා අගය කරයි.

උදා : " **ලොවට දෙන්නා ඔබ යි අහරත් පැසුත්...** "

➤ එමෙන්ම තම පැහැය නිසා උඩඟු වූ සුදු වලාකුළු අහසේ ඉහළින් ගමන් කරද්දී වැහි වලාකුළු ස්වකීය අහසිමානි බව පළ කරමින් පහළින් ගමන් කිරීම සමාජයේ ඇතැම් පුද්ගල චර්යා සමඟ සසඳා ඇත. ඒ කෙසේ ද යත් උසස් ඥාණ වන්ත මිනිසුන් ගුණ දහමින් පිරි අහසිමානි වන්නා සේ ය.

උදා : " **සුදු වලාකුළු බෝ මැ අහස් කුසේ - ඉහළ යෙයි...** "

➤ උතුම් මිනිසුන් ඇසුරු කිරීමෙන් නිවට මිනිසුන් ද තම නිවට බව අතහැර උසස් බවට පත් වීම නම් සංසිද්ධිය පැහැදිලි කිරීමට කවියා යොදා ගෙන ඇත්තේ මුහුදේ ඇති අධික ලවණ රසයෙන් යුත් කරදිය පවා වැහි වලාකුළ විසින් තමා වෙත ඇදගනු ලැබ පසු මිහිරි රසයට පත් වීම නම් අවස්ථාව යි.

උදා : " **මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්...** "

➤ සමාජයේ වෙසෙන උතුම් ගතිගුණ සහිත පුද්ගලයන්ට සමාජයෙන් නිතැතින් ම බුහුමන් හිමි වීම කවියා සමාන කරන්නේ වැහි වලාකුළ සොබා දහම විසින් විදුලිය ආලෝකයෙන් රන් දම් පැලඳු ලෙස සැරසීම යි.

උදා : " **විදුලියත් පැහැපත් රන් දම් සෙයින්...** "

***මෙවැනි කරුණු සහිත ව උදාහරණ කුසලතාවත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දී තිබිය යුතු ය.***

*උදාහරණයකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.*
*අදාළ විස්තරයට ලකුණු 03යි.*
*(ලකුණු 03 +03 = 06යි)*

3

| |
|---|
| • මෙම පද්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට හේතු වී ඇති කරුණු |

➤ පද්‍ය නිර්මාණයේ තේමාවට උචිත නිර්මාණශීලී භාෂා භාවිතය

වැහි වලාකුළට සජීවී ගුණයන් ආරෝපණය කරමින් 'ඔබ' යනුවෙන් ආමන්ත්‍රණය කරමින් පද්‍ය පන්තිය රචනා කරයි.

උදා : " **වැහි වලාකුළ පැ කළු යැයි ඔබේ...** "

➤ විද්‍යානුකූල බස් වහරක් යොදා ගනී.

උදා : " **කුරු ලියත් ලිය - ලයි සැනසී දියෙන්...** "

➤ ස්වාභාවික සංසිද්ධි හා පුද්ගල චර්යා සංසන්දනය කරමින් සමාජය පිළිබඳ සියුම් විවරණයක් සිදු කරයි.

**උදා : " සුදු වලාකුළු බෝ මැ අහස් කුසේ... "**

➤ උසස් පුද්ගල ඇසුරෙන් නිවටයන් ද උසස් වන බව පෙන්වා දෙයි.

**උදා : " කටට ගැන්ම ද මෝ අමාරු වූ... "**

➤ සිරුරේ පැහැය කළු වූ පුද්ගලයන් දුදනන් ලෙසත් පැහැයෙන් සුදු වූ පුද්ගලයන් සුදනන් ලෙසත් සමාජයේ පවතින සාම්ප්‍රදායික දෘෂ්ටියට අභියෝග කරමින් සිරුරේ පැහැයෙන් පුද්ගල අභ්‍යන්තරය හෙළි නොවන බව පෙන්වා දෙයි.

**උදා : " සිරුරු පැහෙනු'ගත් සුදනෝ ලොවේ**
**නොහඳුනත් උතුමන් ගුණයෙන් වීතා... "**

***මෙවැනි කරුණු සහිත ව උදාහරණ කුසලතාවත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දී තිබිය යුතු ය.***

*උදාහරණයකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.*
*අදාළ විස්තරයට ලකුණු 03යි.*
*(ලකුණු 03 +03 = 06යි)*
*(ලකුණු 06 x 5 = 30යි)*

2. ළමා සිතුම් පැතුම් සහ ගති පැවතුම් නිරූපණයෙහි ලා 'වෙසක් පහන' කෙටිකතාවේ රචකයා දැක්වූ සමත්කම නිදසුන් **තුනක්** දක්වමින් සාකච්ඡා කරන්න.

- ළමා වියෙහි පසුවන එක ම පවුලේ සහෝදර සහෝදරියන් තිදෙනෙකුගේ සිතුම් පැතුම්, ගති පැවතුම් මෙන් ම ඔවුන් අතර පැවති බැඳීම ද 'වෙසක් පහන' කෙටිකතාවෙන් මැනවින් නිරූපණය වී තිබේ.
- වෙසක් උත්සවය ළං වෙද්දී වෙසක් කූඩු සෑදීමටත් වෙසක් දිනයේ දී ඒවා දැල් වීමටත් සිතෑ ම කුඩා දරුවකු තුළ පැවතිය හැකි කැමැත්ත සහ බලාපොරොත්තුව මෙම කෙටිකතාවේ දරුවන් තිදෙනාට ද පොදු ය.

  උදා:- ***"විශාල අටපට්ටම් කූඩුවක් සෑදීමේ අදහස පළමුවෙන් ඇති වූයේ අයියාගේ සිතෙහි ය."***

- මෙම කතාවේ වැඩිමහල් පිරිමි සහෝදරයාගේ මෙහෙය වීමෙන් අටපට්ටම් වෙසක් කූඩුවක් සකස් කරන ආකාරයත් බාල සහෝදරයා සහ සහෝදරිය ඒ සඳහා අයියාට අනුබල දෙමින් උදව් කරන ආකාරයත් නිරූපණය කර තිබේ.

  ***උදා:- "නංගීත් මමත් අයියා ඊට මෙහෙයවීමු"***

- අයියා සහිත උණ පතුරු තමා අසලින් තබා ගැනීමට නංගී සහ මල්ලී ගන්නා අහිංසක උත්සාහය ළමා මනසේ සුන්දර බව නිරූපණය කරන අවස්ථාවකි.

  ***උදා:- "අයියා සැස පසෙක තැබූ උණ පතුරක් මා දකින්නට පෙර..."***

- එවැනි අවස්ථාවල දී සහෝදර සහෝදරියන් අතර ඇති වන සුළු සුළු ගැටුම් හා අඬ දබරත් ඒවා ඉතා කෙටි කාලයකින් සමථයකට පත් වී ඔවුන් නැවත මිතුරු වන ආකාරයත් තාත්වික ලෙස නිරූපණය කර තිබේ.

  ***උදා:- "අයියේ කූඩුව බලන්න යමු..."***

- වෙසක් පහන සකස් කිරීමේ කාර්යය ටිකෙන් ටික නිම වන විට කුඩා දරුවන්ගේ සිත් තුළ දැල්වෙන බලාපොරොත්තු සහ ඔවුන් එමගින් අත්විඳින සතුට කෙටිකතාවේ මැනවින් නිරූපිත ය.

  ***උදා:- "අපේ කූඩුව තරම් ලස්සන කූඩුවක් නොහෙවත් නෑ නේ ද..."***

- මල්ලීගෙන් සිදු වූ අත් වැරැද්දක් නිසා වෙසක් පහන ගිනි ගන්නා අවස්ථාවේ අයියා පිලිස්සී මිය යනු ඇතැ යි එම කුඩා සහෝදරයාගේ සිතෙහි තට ගත් බිය තාත්වික ලෙස නිරූපණය කර ඇත.

  ***උදා:- "කරත්තය පමා වන්නේ අයියා දොස්තර ගෙදර දී මළ හෙයිනැයි මට සිතිණ..."***

- එවන් අවස්ථා මගින් සහෝදරයන් අතර පවතින ආදරය සහ බැඳීම ද මනා ලෙස ප්‍රකට කර ඇත.

*අදාළ උදාහරණ සඳහා එක් උදාහරණයකට ලකුණු 02 බැගින් ලකුණු 06යි. (02 x 3 = 06යි)*

*එම උදාහරණ මැනවින් විග්‍රහ කර ඇත්නම් ලකුණු 06යි. (02 x 3 = 06යි)*

*භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.*

*නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිත ව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.*

*(ලකුණු 06 +06+02+01 = 15ය*

*(ලකුණු 15යි)*

3. **'අලුත ගෙනා මනාලිය' පද්‍ය පන්තියේ දී මනාලියකගේ චර්යා මැනවින් නිරූපණය කිරීමට කවියා සමත් වී ඇති ආකාරය නිදසුන් තුනක්වත් භාවිත කරමින් පැහැදිලි කරන්න.**

- අලුත ගෙනා මනමාලිය පද්‍ය පන්තියේ දී අලුත විවාහ පත් වූ මනාලියකගේ ලැජ්ජාශීලී මෙන් ම ළද බොළඳ ගති ස්වභාවය මැනවින් නිරූපණය කිරීමට කවියා සමත් වී තිබේ.
- අලුත් මනමාලිය විළියෙන් බර ව නමා ගත් හිසින් යුතු ව නිවසේ ඔබ මොබ යන ආකාරය කවියා විස්තර කරයි.

  *උදා:- "හිස නමාගනී ඈ*
  *සිහින් අතැඟිලි පටලවාගනී... "*

- අලුත් මනාලියක් විවාහ වී සැමියාගේ නිවසට යන විට ආභරණ සහ ඇඳුම් පැලඳුම් රැගෙන ඒම සිරිතක් ලෙස කරන අතර එම ඇඳුම් ආයිත්තම් සහ ආභරණ පෙට්ටි රැගෙන මනාලිය නිවසේ ඔබ මොබ යන ආකාරය ද කවියා තාත්වික ආකාරයෙන් නිරූපණය කරයි.

  *උදා:- " දැල් තිර අස්සෙන් පෙනෙයි ඈ ... "*

- මෙම තරුණ මනමාලිය සැමියා වෙත හේතුවක් නැතිව ද පැමිණෙන නමුත් ඇගේ ලැජ්ජාශීලී බව නිසා ම ඉක්මනින් පලා යන බව පැවසීම ද අලුත විවාහපත් මනාලියකගේ චර්යා මැනවින් නිරූපණය වන අවස්ථාවකි.

  *උදා:- "මා වෙත එනත් ඈ*
  *වුවමනාවක් කිසිත් නැතිව ද නොරැඳෙයි. පලා යයි ..."*

- මේ ආකාරයෙන් අලුත විවාහ පත් වූ තරුණ මනාලියකගේ ලැජ්ජාශීලී බව, දඟකාර බව ප්‍රබෝධවත් බව මෙන්ම සුන්දරත්වය ද කවියා මැනවින් නිරූපණය කර ඇත.

*අදාළ උදාහරණ සඳහා එක් උදාහරණයකට ලකුණු 02 බැගින් ලකුණු 06යි. (02 x 3 = 06යි)*
*එම උදාහරණ මැනවින් විග්‍රහ කර ඇත්නම් ලකුණු 06යි. (02 x 3 = 06යි)*
*භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.*
*නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිත ව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.*
*(ලකුණු 06 +06+02+01 = 15යි)*
*(ලකුණු 15යි)*

4. "තමන් හැර ගිය පබාවතියගේ සිත දිනා ගැනීමට කුස කුමරයා ගත් උත්සාහය කුස ජාතකයෙන් මැනවින් නිරූපණය වේ." නිදසුන් **තුනක්වත්** ඇසුරෙන් විමසන්න.

- කුස ජාතකයට අනුව කුස කුමරයාගේ විරූපී බව සඟවා උපායශීලී ලෙස පබාවතිය විවාහ කර ගැනීමෙන් පබාවතිය යම් වංචාවකට හසු විය.
- පබාවතිය වංචනික විවාහයකට හසු කර ගැනීමෙන් තම පාර්ශ්වයෙන් වරදක් සිදු වූ බවට කුස රජු පසුතැවිලි වන බව ද නිරූපිත ය.
- පබාවතිය ඇත්ත හෙළි කර ගත් මොහොතේ ඇය බලහත්කාරයෙන් තම මාළිගයේ රඳවා ගැනීමට කුමරු උත්සාහ නොකරයි.

  ***උදා:- "මූ යන්ට අවසර නොලද්දූ නම් ළය පැලී මිය යන්නාහ."***
- ඇයට කැමති තම දෙමාපියන් වෙත යාමට ඉඩ දෙන කුස රජු පසුව ඇය සොයා සාගල නුවරට ගොස් ඇයගේ සිත දිනා ගැනීමට උත්සාහ කරයි.
- කුස රජ තම මාළිගයේ රජ සැප ද අතහැර සාගල නුවරට ගොස් බොහෝ දුක් පීඩා විඳිමින් පබාවතියගේ සිත දිනා ගැනීමට උත්සාහ දරයි.

  උදා:-
  - ***" වීණාවාදකයෙකු ලෙස වෙස්වළාගෙන වීණා වාදනය කිරීමෙන් පබාවතියගේ සිත දිනා ගැනීමට උත්සාහ කිරීම"***
  - ***"කුඹලෙකු මෙන් සේවය කරමින් පබාවතියගේ සිත ගැනීම සඳහා විසිතුරු වළං නිර්මාණය කිරීම "***
  - ***පබාවතියගේ රූපය සහිත විසිතුරු තල් වැටක් නිර්මාණය කිරීම***
  - ***විසිතුරු මල් වැලක් ගොතා පබාවතියට යැවීම .***
  - ***මද්‍ර රජුගේ මාළිගයේ අරක්කැමියෙකු ලෙස සේවය කරමින් ඉඳුල් වළං සෝදමින් පබාවතියගේ සිත දිනා ගැනීමට උත්සහ ගැනීම***
- මෙවැනි උදාහරණවලින් තහවුරු වන්නේ පබාවතිය පිළිබඳ කුස රජුගේ දැඩි ආලය යි.
- පබාවතිය විසින් කුස රජු දැඩි ව ප්‍රතික්ෂේප කරනු ලැබුව ද ඇය කෙරෙහි වූ ආලය අත් නොහැර දිගින් දිගට ම ඇයගේ සිත දිනා ගැනීම සඳහා කුස රජ උත්සහ දරයි.
- තමා පිළිබඳ ඇති තතු සඟවා පබාවතිය වංචා සහගත ලෙස විවාහයට එකඟ කරවා ගැනීමෙන් තම පවුලේ අය වෙතින් ඇයට සිදු වූ වරද නිවැරදි කර ගෙන ඇය කෙරෙහි තමා සිතෙහි පවත්නා අවංක වූ ප්‍රේමය ඇයට අවබෝධ කර දී ඇයගේ සිත දිනා ගැනීමට කුස රජ ගන්නා උත්සාහය කුස ජාතකයෙන් මැනවින් නිරූපණය කර ඇත.

*උපුටා ගැනීම් සහිතව පිළිතුරු ලිවිය යුතු ය*
*අදාළ උදාහරණ සඳහා එක් උදාහරණයකට ලකුණු 02 බැගින් ලකුණු 06යි. (02 x 3 = 06යි)*
*එම උදාහරණ මැනවින් විග්‍රහ කර ඇත්නම් ලකුණු 06යි. (02 x 3 = 06යි)*
*භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.*
*නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිත ව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.*
*(ලකුණු 06 +06+02+01 = 15යි)*
***(ලකුණු 15යි)***

5. උචිත පද, සංකල්ප රූප සහ විද්මය භාවිතය 'වැස්ස' පද්‍ය පන්තියේ සාර්ථකත්වයට හේතු වී ඇති ආකාරය නිදසුන් තුනක් ආශ්‍රයෙන් විමර්ශනය කරන්න.

__උචිත පද__

- පද්‍ය පන්තියේ තේමාවට උචිත ලෙස පද භාවිත කරමින් එහි රසය නිපදවීමට කවියා සමත් වී ඇත.
- වර්ෂාව අවස්ථාවක සිදු වන විවිධ සංසිද්ධි විස්තර කරමින් වර්ෂාව පිළිබඳ හැඟීම් සහෘදයාට දැනෙන ආකාරයෙන් වචන යොදා ගැනීමට කවියා උත්සාහ දරා ඇත.

  උදා :-

  *"උදේ සිට අද හැලෙන..."*
  *"හිරිකිතයෙන් කිලි පොලන..."*
  *"නොපායන හිරු දවස..."*
  *"ගොහොරු මඩ ඇඟිලිකරු අතර චිරි චිරි ගාන..."*
  *"තෙමුණු රෙදි ඇඟ ඇලුණ..."*
  *"දෙරිරෙ ගොස් හැම තැනම..."*
  *"තෙත රෙද්ද ඇඟ එතුව..."*
  *"මඩව කෙස් තෙත බරිව..."*

- වැනි උචිත යෙදුම් හා පද මනාව ගැළපීමෙන් වර්ෂා අවස්ථාවකට මුහුණ දුන් පුද්ගලයෙකුට එයින් සිදුවන පීඩාව හා එම පුද්ගලයා එම අවස්ථාවේ අත්විඳි මනෝභාව මැනවින් නිරූපණය කර තිබේ.

__සංකල්ප රූප__

- වැස්ස පද්‍ය පන්තියෙහිලා කවියා මවන සංකල්ප රූප එම පැදි පෙළෙහි සාර්ථකත්වයට හේතු වී ඇත.

- වර්ෂාව ඇති අවස්ථාවක පරිසරයේ ස්වභාවය හා වර්ෂාවට මුහුණ දෙන පොදු ජනයාට එයින් අත්වන පීඩාව සහෘද මනසේ චිත්‍ර රූප මැවෙන ආකාරයෙන් ඉදිරිපත් කිරීමට කවියා සමත් වෙයි.

  උදා :-

  *"ගොහොරු මඩ ඇඟිලිකරු අතර චිරි චිරි ගාන..."*
  *"මඩ කඩිති හැම තැනම..."*
  *"තෙමුණු රෙදි ඇඟ ඇලුණ..."*
  *"වක්කලන් ඇළි හැදුණ..."*
  *"තෙත රෙද්ද ඇඟ එතුව..."*
  *"කාර් රෝදෙන් විසිස් ඇගපුරා මඩ ඉහෙන..."*

- කවියා ස්වකීය පැදි පෙළෙහි විස්තර කරන වර්ෂා දිනයේ සිදු වූ සංසිද්ධි පිළිබඳ සහෘදයාට ඉතා මැනවින්, විචිත්‍ර සංකල්ප රූප මවා ගත හැකි වී තිබේ. එය පද්‍ය පන්තියේ සාර්ථක ලක්ෂණයකි.

සංකල්ප රූප

- වැස්ස පද්‍ය පන්තියෙහි තේමාවට මනාව ගැළපෙන රිද්මයක් තෝරා ගැනීමට සමත් ව තිබේ.
- වර්ෂාවේ රිද්මය ශ්‍රව්‍ය ගෝචර ආකාරයෙන් පද්‍ය පන්තියෙන් නිරූපිත ය.
- අනුප්‍රාසවත් රිද්මයානුකූල වදන් භාවිතයෙන් වර්ෂාවේ රිද්මය මතු කිරීමට කවියා උත්සාහ දරා ඇත.

  උදා :-

  *"චිරිචි චිරි චිරිචි චිරි..."*
  *"වහින වැහි වහින වැහි..."*
  *"චිරි චිරි ගාන..."*
  *"කාර් රෝදෙන් විසිස්..."*
  *"උණට උණු සේ වතුර..."*
  *"හිත හිතා ලත වේය..."*

- වැනි රිද්මයානුකූල යෙදුම් හා පද ගැළපීම වර්ෂාවේ රිද්මයට අනුරූප බැව් පැහැදිලි වේ.
- මෙම ලක්ෂණ වර්ෂාව පද්‍ය පන්තියේ සාර්ථකත්වයට හේතු වී ඇත.

*උදාහරණ සඳහා එක් උදාහරණයකට ලකුණු 02 බැගින් ලකුණු 06යි. (02 x 3 = 06යි)*
*එම උදාහරණ මැනවින් විග්‍රහ කර ඇත්නම් ලකුණු 06යි. (02 x 3 = 06යි)*
*භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.*
*නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිත ව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.*
*(ලකුණු 06 +06+02+01 = 15යි)*
***(ලකුණු 15යි)***

WWW.PastPapers.WIKI

Download past papers, notes, and more from Past Papers Wiki!